ගරු දේවගැතිතුමෙනි, ගරු දේවගැතිතුමියනි, ගිහි නායක නායිකාවෙනි

අපි මේවන විට නත්තල සැමරුම සඳහා සූදානම් වෙමින් සිටිමු. එහිදී බොහෝ විට අපගේ වැඩි අවධානය යොමු වන්නේ සාම්ප්‍රදායික නත්තල් සැමරුමේ පවතින නත්තල් ගස, කැරොල් ගායනා, නාට්‍ය සහ අනෙකුත් උත්සව අවස්ථාවන් කෙරෙහිය. එමෙන්ම අප සර්ව පිත්තල ලෝකයේ හිරවෙමින් නා නාවිද විලාසිතා, රාත්‍රි සම්භාෂන නැටුම්-ගැයුම්-වැයුම්, මිල අධික සැරසිලි, සුපිරි වෙළෙඳ භාණ්ඩ, කේක් මිශ්‍රන සෑදීම යනා දී දෑ සම්බන්බඳධයෙන් අප අවට සමාජය සමඟ සම්බන්ධවී කටයුතු කිරීමට ඉක්මන් වෙයි. කිතුණු අප නත්තලේ සැබෑ අරුත අමතක කරමින් දැනුවත්ව හෝ නොදැනුවත්ව බාහිර දෑ වෙත යොමුව ඇත. තවද ලෞකීක ආශාවන් සහ සැමරුම් වෙත ද ඇදී ගොස් ඇත.

දෙවිඳුන් මිනිසත් බව ගැනීම, එතුමන් ලොව සැම දෙනා උදෙසා සිදුකළ ශ්‍රේෂ්ඨතම පරිත්‍යාගය බව අප මතක් කරගත යුතුය. උන් වහන්සේ සිය තේජස, බලය අතහැර ලෝකයට පැමිණියේ සකළ මිනිස් වර්ගයා පාපයෙන් හා වහල්භාවයේ යදම් වලින් මුදවා ගැනීම පිණිසය. ඒ සඳහා උන් වහන්සේ උපත ලැබුවේ ගවහලකය. අප සැම දෙනා උදෙසා දෙවිසමිඳුගේ පුජා වීම හා නිහතමාණි බව 'ආගමන' කාලය තුළදී සුවිශේෂී වේ. අපගේ පාපයන්ට සමාව අත් විඳින්නට ද ජීවිතයේ පූර්ණත්වය භුක්ති විඳින්නට ද අප හට හැකි වී ඇත්තේ එතුමන් සිදු කල ඒ අසමසම පරිත්‍යාගය නිසාවෙනි.

එබැවින් නත්තල සඳහා අප සූදානම් වන විට අපගේ ඇතුලාන්තය විමසා බැලීම වැදගත්වේ. දෙවියන් වහන්සේ අප වෙනුවෙන් කළ පරිත්‍යාගය සැබවින්ම අප අවබෝධකර ගෙන තිබේද? අපගේ  වත්මන් සැමරුම් දෙවිසමිඳුන් අප වෙනුවෙන් කළ පරිත්‍යාගය හා ගැලපෙන්නේද? අවංකව නත්තල සැමරීමේ දී ලෝකය අප වෙත පිරිනමන වානිජකරණය වූ නාස්තිකාර වියදම් වෙත ඇදී නොයා සිටීමට කිතුණු ප්‍රජාව ලෙස විමසිලිමත්වීම අවශ්‍යවේ.

නත්තලේ සැබෑම අරුත මෙනෙහි කිරීමටත්, දෙවිඳුන් සමඟ ඇති බැඳීම ශක්තිමත් කර ගනිමින්, උන් වහන්සේව අත්විඳින්නට මෙම කාලය භාවිතා කරන මෙන් අපි බැතිමතුන්ගෙන් ඉල්ලමු. උන් වහන්සේ අප අතර ඉපදුනේ අපව පාපයෙන් ගලවා ගැනීමට හා සෑම ආකාර සමාජ අසාධාරණයනගෙන් නිදහස් කර ගැනීම පිණිසය. අපගේ සියළු සැමරුම් කිතුසමිඳුන්ගේ උපත අප වෙත ගෙනා විමුක්තිය ද ඇතුලාන්ත සාමය හා සියළු ජනයා අතර සාමය, සංහිඳියාව ආවර්ජනය කිරීමට පදනමක් විය යුතුය. සත්‍ය හා ස්ප්‍රිතුවෙන් (ප්‍රාණවත්ව) යුතුව ජේසු බිලිඳුන් නමඳින්නට මෙය අපට උපකාරී වනු ඇත.

එමෙන්ම අපි සැම බැතිමතෙකුගෙන්ම ඉල්ලා සිටින්නේ අවදිව සිටින ලෙෂ ඉල්ලා සිටිමු. වානිජකරණය වූ නත්තල වෙත ඇදි යෑමට ඉඩනොදී පරික්ෂාකාරීව සිටින්න. ඒ වෙනුවට 'මිනිසත් බව ගැනීමේ' අධ්‍යාත්මික අරුත කෙරෙහි අවධානය යොමු කරන්න.

වානිජ කරනයට හසු නොවී  සැබෑ අර්තවත් නත්තලක් සැමරීමට අවශ්‍ය අදහස් හා යෝජනා ඇතුලත් පොත් පිංචක් මේ සමඟ එවා ඇත. එය සියළු බැතිමතුන් අතරේ බෙදා හරින මෙන් ඉල්ලා සිටිමු.

නත්තලේ අරුත අවබෝධ කර ගැනීම පිණිස අපට මඟ පෙන්වීම සඳහා 2018.11.22 පෝය දින හෝ ඔබ සභාවට පහසු දිනයක යාච්ඤා කාලයක් වෙන් කර ගන්නා මෙන් අපි ඉල්ලා සිටිමු. ඕතොඩොක්ස් සම්ප්‍රදායට අනුව උපවාස කාලයක් පවත්වා, නිරහාරයෙන් ද යාච්ඤාවෙන් ද පෙරටුව 'ආගමන' සමය සැමරීමට පිවිසෙන බව අප සිහියට නංවා ගැනීම අවශ්‍යවේ.

අපගේ සැමරුම් අර්ථාන්විත වේවා දෙවිඳුන්ගේ පැමිණීම, මුණගැසීමට අපව සූදානම් කිරීමට හැකි වේවා.

අත්සන් කරන ලද්දේ:

ගරු හේෂාන් ද සිල්වා දේවගැතිතුමා - සභාපති, ශ්‍රී ලංකා බැප්ටිස්ට් සංගමය සහ
සභාපති - ශ්‍රී ලංකා ජාතික ක්‍රිස්තියානි මණ්ඩලය
අතිගරු ඩී. ආර්. කනගසබෙයි රදගුරුතුමා - ලංකා සභාව, කොළඹ දියෝකීසිය
අතිගරු කීර්තිසිරි ප්‍රනාන්දු රදගුරුතුමා - ලංකා සභාව, කුරුණෑගල දියෝකීසිය
ගරු සමන් පෙරේරා දේවගැතිතුම - සභාපති, ශ්‍රී ලංකා ප්‍රෙස්බිටේරියන් සභාව
අතිගරු ධර්මාචාර්ය ඩැනියල් එස්. තියාගරාජා රදගුරුතුමා දකුණු ඉන්දියානු සභාව
යාපනය දියෝකීසිය
ගරු ආසිරි පී. පෙරේරා දේවගැතිතුමා - මහ නායකතුමා/රදගුරුතුමා ශ්‍රී ලංකා මෙතෝදිස්ත සභාව
ගරු ෂර්ලි එස්. ෆේබර් දේවගැතිතුමා - සභාපති, ක්‍රිස්තියානි රෙපරමාදු සභාව
කර්නල් යුසාෆ් මාසියා - ප්‍රාදේශීය භාර මූලිකතුමා, ගැලවීමේ හමුදාව
ගරු ඩී. නඩරාජා දේවගැතිතුමා - සභාපති, ශ්‍රී ලංකා ලුතරන් සභාව
ගරු මයිකල් දිසානායක දේවගැතිතුමා - සභාපති, ජනතා දේව සභාව
ගරු ලෙස්ලි කීගල් දේවගැතිතුමා - සභාපති, ශ්‍රී ලංකා සිව් චතුරශ්‍ර සභාව
ගරු ටි. තේවනේසන් දේවගැතිතුමා - ඇමරිකන් සිලොන් මිෂන් සභාව
ගරු ඩබ්ලිව්. පී. එබනේසර් ජෝසෆ් දේවගැතිතුමා - මහ ලේකම්,
ශ්‍රී ලංකා ජාතික ක්‍රිස්තියානි මණ්ඩලය

**සාමාජික සාමයික සංවිධාන**

තරුණ ක්‍රිස්තියානි සංගමය (YMCA)
තරුණ කාන්තා ක්‍රිස්තියානි සංගමය (YWCA)
ලංකා බයිබල් සමාගම
දේවධර්ම ශාස්ත්‍රාලය කොළඹ
ලංකා දේවධර්ම ශාස්ත්‍රාලය පිළිමතලාව
ශිෂ්‍ය ක්‍රිස්තියානි ව්‍යාපරය (SCM)
ලංකා ක්‍රිස්තියානි සාහිත්‍ය සමාගම
ජීවිතාලෝකය
යොවුන් කිතු මඟ